SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB

වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

තනතුරු පුරප්පාඩු (කොන්ත්‍රාත් පදනම)

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ නියාමන, සංවර්ධන සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු ඉටුකිරීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව තුළ පවතින පහත දැක්වෙන තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා වසරක කොන්ත්‍රාත් පදනම මත සුදුසුකම් ලත් කාර්යශීලී, උද්‍යෝගීමත් හා විචක්ෂණශීලී ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. කළමනාකරණ සහකාර (පොත් තබන්නා) (III ශ්‍රේණිය) - (MA 1-1) තනතුරු පුරප්පාඩු 01

රැකියා පිරිච්තරය :

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ බලයලත් නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ තේ මණ්ඩලයේ ගිණුම් වාර්තා සකස් කිරීම, යාවත්කාලීන කිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධ කාර්යයන් ඉටු කිරීම.

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

බාහිර අයදුම්කරුවන් සඳහා :

අ.පො.ස.(උ/පෙ) විභාගයෙන් වාණිජ අංශයෙන් එකවර විෂයන් තුනකින් සමත්වීම සහ අ.පො.ස (සා/පෙ) විභාගයෙන් ගණිතය, ඉංග්‍රීසි සහ සිංහල/දෙමළ විෂයයන් ද ඇතුළුව සම්මාන 04 ක් සහිතව විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් වී තිබීම.

පොත් තැබීම/ගිණුම්කරණය පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් වනු ඇත.

තෝරා ගැනීමේ ක්‍රමවේදය :

ලිඛිත විභාගයකින් සමත් වීමෙන් පසු ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

ලිඛිත පරීක්ෂණය සඳහා විෂයයන්, ලකුණු ලබාදීමේ ක්‍රමවේදය හා විභාග මාධ්‍යය

විෂය	කාලය හා ලකුණු	විභාග මාධ්‍යය
• භාෂා හැකියාව	(ලකුණු-100) (පැය - 1 ½)	ඉංග්‍රීසි හා සිංහල භාෂා දැනුම පරීක්ෂා කෙරේ.
• අභියෝග්‍යතා පරීක්ෂණය	(ලකුණු-100) (විනාඩි - 45)	සිංහල හෝ දෙමිළ මාධ්‍යය
• සාමාන්‍ය දැනුම	(ලකුණු-100) (පැය - 01)	සිංහල හෝ දෙමිළ මාධ්‍යය
• පරිගණක හැකියාව	(ලකුණු-100) (පැය - 01)	ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණි

විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යය අයදුම්පත්‍රයේ සටහන් කළ යුතුය.

ලිඛිත විභාගය සමත්වීම සඳහා එක් විෂයකට අවම වශයෙන් 40% ක් ලකුණු ලබා තිබීම සහ සමස්ත විභාගයෙන් 50% ක සාමාන්‍යයක් ලබා තිබීම අවශ්‍යය.

වැටුප් පරිමාණය :

MA 1-1 : රු. 46,220/- 10 x රු. 540/- 7 x රු. 630/- 4 x රු. 890/- 20 x රු. 1,190/- රු. 83,390/- (මාසිකව)

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 උපලේඛන II අනුව ආරම්භක මාසික වැටුප් පියවර **රු. 43,312/-** හා රජයේ අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

වයස් සීමාව :

අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

කොන්ත්‍රාත් කාලය :

වසර 01 කි. (මාස 12)

2. රියැදුරු (III ශ්‍රේණිය) - (PL3) - තනතුරු පුරප්පාඩු 02

රැකියා පිරිච්තරය :

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රවාහන අවශ්‍යතා සැපයීමට අදාළ වාහන පැදවීම සහ නඩත්තු කිරීමට අදාළ රාජකාරී ඉටු කිරීම.

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

බාහිර අයදුම්කරුවන් සඳහා :-

(අ) ගණිතය, සිංහල/දෙමළ ඇතුළුව විෂයයන් හයක් සමඟ අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී තිබීම.

සහ

(ආ) බර වාහන පැදවීම සඳහා වලංගු බලපත්‍රයක් සහ පිළිගත් ආයතනයක බර වාහන පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් අවුරුදු තුනක (03) සතුටුදායක පළපුරුද්දක් තිබීම.

තෝරා ගැනීමේ ක්‍රමවේදය :

ප්‍රායෝගික පරීක්ෂණයකින් පසුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

වැටුප් පරිමාණය :

PL-3 : රු. 43,280/- 10 x රු. 490 - 10 x රු. 540 - 10 x රු. 590/- 12 x රු. 630/- රු. 67,040/- (මාසිකව)

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 උපලේඛන II අනුව ආරම්භක මාසික වැටුප් පියවර **රු. 40,834/-** හා රජයේ අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

වයස් සීමාව :

අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

කොන්ත්‍රාත් කාලය :

වසර 01 කි. (මාස 12)

වෙනත්/පොදු ප්‍රතිලාභ :

- තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔහුගේ/ඇයගේ වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සඳහා ගෙවිය යුතු අතර මණ්ඩලය ඒ සඳහා 15% කින් දායක වනු ඇත.
- මණ්ඩලය තවදුරටත් සේවා නියුක්ත භාර අරමුදලට ඔහුගේ/ඇයගේ වැටුපෙන් 3% කින් දායක වනු ඇත.

අයදුම් කිරීම :

රජයේ දෙපාර්තමේන්තු රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශයද සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. මෙම කාර්යාලයෙන් හෝ **http:/www.srilankateaboard.lk** වෙබ් අඩවියෙන් ලබාගත් නියමිත ආකෘති පත්‍රය පරිදි සකස් කරන ලද අයදුම්පත් උප්පැන්න සහතිකයේ සහ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමඟ **2026 නොවැම්බර් මස 17** වන දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලි.ප.තැ එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
574, ගාලු පාර,
කොළඹ 03.

SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB